- පරිගණක විද්‍යාගාරය තුළ ඇති දේවල්
    - පරිගණක
    - පරිගණක පර්යන්ත
    - බල රැහැන්
    - දත්ත රැහැන්
    - ජාල මෙවලම්
    - බහුමාධ්‍ය ප්‍රක්ෂේපකය
    - ආවයන උපාංග
- පරිගණක මෙවලම්වල භෞතික හානි සිදුවන අවස්ථා
    - දූවිලි හා ආර්ද්‍රතාවය සහිත පරිගණක කොටස්
    - කැඩුණු බල රැහැන්
    - මේස කෙළවර ස්ථානගත කරන ලද පරිගණක හා පර්යන්ත උපාංග
    - විදුලි සැර ඇති අවස්ථාවලදී පරිගණක භාවිතය
    - එකම පේනුවකින් පරිගණක වැඩි ගණනක් භාවිතා කිරීම
- උපකරණ ආරක්ෂා කිරීම සඳහා කොන්දේසි
    - කිසිම ආහාර පානයක් පරිගණකය අසලට රැගෙන නොයන්න.
    - පරිගණකය භාවිතයෙන් පසු එය වසා තබන්න.
    - වෛරස සඳහා පරිලෝකනය කිරීමකින් තොරව බාහිර උපාංග පරිගණකයට ඇතුළ් නොකරන්න.
    - පරිගණක විද්‍යාගාරයක විශාල පරිගණක සංඛ්‍යාවක් තිබෙන නිසාත් එය අධික රත්වීමකට හේතුවන නිසාත් පරිගණක විද්‍යාගාරය සිසිල්ව පවතින බවට තහවුරු කර ගන්න. මෙය පරිගණක ආරක්ෂාව තහවුරු කර ගැනීමේ විධි ක්‍රමවලින් එකක් වේ.
    - බල සැපයුමට සම්බන්ධ කර ක්‍රියාත්මකව පවතින විට කිසිම පරිපථ පුවරුවක් හෝ කෙවෙනියක් ස්පර්ශ කිරීමට උත්සාහ නොකරන්න.
    - දූවිලි පරිගණකයට හානිකර ලෙස බලපෑ හැකිය. එම නිසා නිතිපතා පරිගණක පිරිසිදුව පවතින බව තහවුරු කරගන්න.
    - බල සැපයුම බිඳ වැටීම, දත්ත හානිවීමට/දත්ත විකෘතිවීමට/දත්ත ක්‍රමවත්ව ක්‍රියා නොකිරීමට හේතු විය හැකිය.මිනිත්තු කිහිපයක් සඳහා බල උපස්ථයක් ලෙස,UPS ප්‍රධාන වශයෙන් භාවිතා කළ හැකිය. එය හදිසි අවස්ථාවකදී භාවිතයට ගත හැකි විදුලිබල ප්‍රභවයකි.
- ඔබේ ආරක්ෂාව සඳහා කොන්දේසි
    - පරිගණක විද්‍යාගාරය තුළ දුවන්න එපා.
    - ගිණි ආරක්ෂාව වෙනුවෙන්, කාමරයේ පිටවීමේ දොරටු පිහිටි ස්ථාන හා ගිණි නිවීමේ උපකරණ පිහිටි ස්ථාන පිළිබඳ සැලකිලිමත් වන්න.
    - අඛණ්ඩව අතිශයින් දිගු කාලයක් යතුරුලියනය කිරීමට උත්සාහ නොකරන්න.
    - කාමරයේ තැන තැන විසිරී තිබීමෙන් පය පැටලීමට ඉඩ ඇති නිසා එවැනි දේ නියමිත ස්ථානවල තබන්න.
    - ඇසට විවේකයක් දීම සඳහා වරින් වර තිරයෙන් ඇස ඉවතට ගන්න.
    - නිරාවරණයවූ කිසිම රැහැනක් හෝ කෙවෙනියක් ස්පර්ශ කිරීමෙන් වළකින්න.
    - පරිගණකය ක්‍රියාත්මකව පවතින විට පරිගණකය විවෘත කිරීමෙන් හා එය පිටුපස ස්පර්ශ කිරීමට උත්සාහ කිරීමෙන් වළකින්න.
    - විද්‍යුත් ආරක්ෂාවට බලපාන නිසා නඩත්තු කටයුතු සඳහා ජලය හෝ කිසිම දියරයක් පරිගණකය මත වැගිරීමෙන් වළකින්න.

- පරිගණක විද්‍යාගාරය භාවිතයට පෙර තහවුරු කරගත යුතු දේ
    - ප්‍රධාන විදුලි සැපයුම හා බිත්ති පේනු පරීක්ෂා කරන්න.
    - UPS හරහා පරිගණක සම්බන්ධ කිරීම පරීක්ෂා කරන්න.




රූපය **3.1.1 -UPS** හරහා පරිගණක සම්බන්ධ කිරීම

- පරිගණක විද්‍යාගාරය භාවිතයෙන් පසු තහවුරු කරගත යුතු දේ
    - UPS අක්‍රිය කිරීම පරීක්ෂා කරන්න.
    - පරිගණක බල අක්‍රිය කිරීම පරීක්ෂා කරන්න.
    - ප්‍රධාන විදුලි සැපයුම අක්‍රිය කිරීම පරීක්ෂා කරන්න.
    - දූවිලි, ආර්ද්‍රතාව, සහ කෘමීන් ආදියට එරෙහිව අවශ්‍ය ක්‍රියාකාරකම් යොදන්න.